# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 4 දරන බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ජනවාරි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 පෙබරවාරි මස 01 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිළ : රු. 7.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2008 අංක 4 දරන බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2008 ජනවාරි මස 28 වන දින]

එල්. ඩී. —ඕ. අයි. එන්. සී. (34/2005)

බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීති අනුව, එකී බෞද්ධ සංගමය හා සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 4 දරන බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන්පසුව (මෙහි මින් මතු "බෞද්ධ සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) "බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. බම්බලපිටිය මහල් නිවාස බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි, මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ

(අ) බෞද්ධාගම ද, බම්බලපිටිය මහල් නිවාසවල හා ඒ අවට පදිංචි ව සිටින බෞද්ධයන්ගේ ආගමික වත් පිළිවෙත් සහ සම්ප්‍රදායයන්ද ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම ;

2—PL-002343-2,750 (2007/08)

(ආ) බෞද්ධාගමේ සියලු අංග අධ්‍යයනය කිරීමටත්, ඒ සම්බන්ධව පර්යේෂණ කිරීමටත් අනුග්‍රහ දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඇ) බෞද්ධාගම ඉගැන්වීම පිණිස සහ බුද්ධ ධර්මය හා සාරධර්ම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා බුද්ධ ධර්මය හා බෞද්ධ සාරධර්මවලට අනුකූලව ඔවුන්ගේ ජීවිත ගෙන යාමට උනන්දු කරවීම ද පිණිස අධ්‍යාපනික ආයතන පිහිටුවීම සහ පවත්වා ගෙන යාම;

(ඈ) බෞද්ධ උත්සව, චාරිත්‍රවිධි, වත් පිළිවෙත්, ව්‍යවහාරයන් හා සම්ප්‍රදායයන් ප්‍රවර්ධනය කිරීම හා පෝෂණය කිරීම සහ විහාර, ආශ්‍රම, පිළිම, භාවනා මධ්‍යස්ථාන හා අනෙකුත් සිද්ධස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම;

(ඉ) බම්බලපිටිය මහල් නිවාසයන්හි හා ඒ අවට වෙසෙන බෞද්ධ ජනයාට අධ්‍යාපන පහසුකම් සහ ඊට සම්බන්ධ අනිකුත් සේවා සැපයීම;

(ඊ) සාමය ප්‍රවර්ධනය කිරීම හා ජනතාව අතර ආගමික, ජනවාර්ගික හා ජාතික සමගිය පෝෂණය කිරීම;

(උ) සමාජ හා ශුභ සාධන සේවා සැපයීම සහ බම්බලපිටිය ජාතික මහල් නිවාසයන්හි ජීවත්වන බෞද්ධ ප්‍රජාව සඳහා ප්‍රජා ශුභ සාධන හා පුහුණු මධ්‍යස්ථාන හා ආයතන පිහිටුවීම හා පවත්වා ගෙන යාම;

(ඌ) බම්බලපිටිය මහල් නිවාසයන්හි හා ඒ අවට වෙසෙන බෞද්ධ ජනයාගේ ශුභ සිද්ධිය සඳහා පුස්තකාල, තොරතුරු හා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම;

(එ) තාක්ෂණ හෝ ඊට සමාන ව්‍යවසායයන්හි ස්වයං රැකියාවක් ලෙස යෙදීම සඳහා බම්බලපිටිය මහල් නිවාසයන්හි හා ඒ අවට වෙසෙන බෞද්ධයන්ට ආධාර කිරීම සහ සහාය වීම සහ එවැනි කර්මාන්තවලට අදාළව ඔවුන් පුහුණු කිරීම;

(ඒ) සංස්ථාවේ අරමුණු වැඩි දියුණු කිරීමෙහි ලා ප්‍රදර්ශන, දේශනා, සම්මන්ත්‍රණ, වැඩ මුළු, පන්ති, විවාද, සම්මේලන හෝ වෙනත් ක්‍රියාදාමයන් පැවැත්වීම; සහ

(ඔ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති, ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි පිහිටි අනෙකුත් සංගම්, සංවිධාන හෝ සමිති සමඟ මිත්‍රශීලි සබඳතා ගොඩනගා ගැනීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය.

4. (1) බම්බලපිටිය ජාතික මහල් නිවාස සංකීර්ණයේ ස්ථිර පදිංචිකරුවන් වන සාමාජිකයන් අතරින් සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන සභාපතිවරයා, උපසභාපතිවරු සිව් දෙනකු, ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික සහ සාමාජිකයන් හය දෙනකුගෙන් සමන්විත වූ මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන විධායක කමිටුවක් විසින් ඒ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීති වලට අනුකූලව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ ධුර දරමින් සිටි කමිටුව සංස්ථාවේ ප්‍රථම කමිටුව විය යුතු අතර, එම කමිටුව සංස්ථාවේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන තෙක් ධුර දරන්නේ ය.

සාමාජිකත්ව නාම ලේඛනය.

5. (1) කමිටුව විසින් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ දී සංස්ථාවේ සාමාජිකයකු වූ ද, සංස්ථාවේ මෙයින් සංස්ථාපනය කරනු ලබන ඉන්පසු යථා පරිදි ඇතුළත් කරගනු ලබන්නාවූ ද සෑම සාමාජිකයකුගේම නම ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට සැළැස්විය යුතු ය.

(2) එම ලේඛනයේ පහත සඳහන් විස්තර, එනම්—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ නම, ලිපිනය සහ රක්ෂාව;

(ආ) සාමාජිකයාගේ නම, නාම ලේඛනයෙහි ඇතුළත් කරන ලද දිනය;

(ඇ) යම් සාමාජිකයකු සාමාජිකයකු වීම අවසන් වූ දිනය

ඇතුළත් විය යුතු ය.

සංස්ථාවේ බලතල.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, අත්කර ගැනීමට, කුලියට, ගැනීමට, ඉදිකිරීමට හෝ අන්‍යාකාරයෙන් ලබා ගැනීමට;

(ආ) අරමුදල් නැංවීම සහ මුදලින් හෝ ඒ හා සමාන අන් වර්ගයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

(ඇ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැළැස්වීම;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගණුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක, ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පතු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වා ගෙන යාමට හා ඒ ගිණුම් වසා දැමීමට;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් ආකාරයකින්, ආයෝජනය කිරීමට;

(ඊ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන නීත්‍යනුකූල භාර කිසිවක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ මවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් නියමය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට ; සහ

(ඌ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙහි සේවක පිරිස් පුහුණු කිරීමට,

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාව විසින් තත් කාර්යය සඳහා කැඳවන ලද යම් මහා සභා රැස්වීමක දී හෝ යම් අතිවිශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර

ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) කමිටුව තෝරා පත් කර ගැනීම, කමිටුවේ සාමාජිකයකු විසින් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ කමිටුවේ බලතල, කාර්යය සහ චර්යාව;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන් සේවයෙන් නෙරපීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය, චර්යාව සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම;

(ඈ) විගණකවරයකු පත් කිරීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් ඉවත් කිරීම සහ ඒ සම්බන්ධයෙන් පාරිශ්‍රමික ගෙවීම;

(ඉ) කමිටුවේ කටයුතු කරගෙන යාම සඳහා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඊ) කමිටුවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(උ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් වන්නා හ.

8. (1) සංස්ථාවට එයටම අරමුදලක් තිබිය යුතු අතර, මින් මතු හෝ මින් පසු සංස්ථාව සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්ථවරණ පැවරීම, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් කමිටුව විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, වැඩි දියුණු කිරීම, සංවර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීම උදෙසා සංස්ථාව විසින් යම් ක්ෂය අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් ඇති කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ඡන්දිය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී ඉටුකිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කවර හෝ ආකාරයකින් ලබා ගනු ලැබුව ද, සංස්ථාවේ මුදල් හා දේපළ හුදෙක් මේ පනතේ දක්වා ඇති පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම අරභයා යොදා ගනු ලැබිය යුතු අතර, ඒ මුදල්වලින් හෝ දේපළ වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් වෙත, කෙළින්ම හෝ වක්‍රාකාරයෙන්, ලාභාංශ හෝ ප්‍රසාද මුදල් වශයෙන් හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

9. (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වා ගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ණය ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් වර්ෂය යම් වර්ෂයක අප්‍රේල් මස 1 වැනි දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 වැනි දින දක්වා වූ කාලය විය යුතු ය.

පවතින සංගමය විසින් ගෙවිය යුතු හෝ සමිතියට අය විය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමය විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තාවූ ද ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සභාපති සහ ලේකම් හෝ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු කළ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.

**14.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

ජනරජයේ සහ අනායන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** ජන රජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**16.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163. කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.